

# කලියුගය

රනිල් වික්‍රමසිංහ

# කලියුගය

| | |
|---|---|
| පරි. අංක | 6902 |
| වර්ග අංකය | 808.4 |
| දිනය | 24.02.2023 |


UNP MEDIA

ප්‍රකාශනයකි.

# කලියුගය

බුදු දහම හා සසුන මුහුණ දෙන

වත්මන් අභියෝගයන් පිළිබඳ

විමසුම් ඇසින් බලන ලිපි සරණිය

**රනිල් වික්‍රමසිංහ**

# සංඝ සභා බලතල ආණ්ඩුවේ නිලධාරීන්ට ලබා දීම වරදක්.

*(කිතලගම හේමසාර නා හිමියන්ට බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක ධූරය පිරිනැමීම වෙනුවෙන් මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානයේ පැවති උත්සවය අමතා කළ කතාව.)*

කිතලගම හේමසාර අපේ ස්වාමීන් වහන්සේට බස්නාහිර පළාතේ සංඝනායක පදවිය ලබාදීම පිළිබඳව මගේ ප්‍රණාමය අමරපුර සංඝ සභාව වෙත ප්‍රකාශ කරන්න මම කැමැතියි. උන් වහන්සේ බුද්ධාගම සහ අධ්‍යාපනය වෙනුවෙන් කරපු සේවය අප සියලු දෙනාම දන්නවා. ඒ සේවය කරන අතර, උන්වහන්සේගේ ගුරුවර පඤ්ඤාසාර නායක ස්වාමීන් වහන්සේ අසනීප වෙලා, රෝද පුටුවකට කොටු වුණු වෙලාවේ, ගුරු හාමුදුරුවන්ට සියළු ඇප උපස්ථාන කටයුතු කරන්නත් වග බලා ගත්තා. අධ්‍යාපන වැඩ කටයුතු, ආධ්‍යාත්මික වැඩ කටයුතු සියල්ල අතරේ අපේ හේමසාර නායක හාමුදුරුවන් තමන්ගේ ගුරු හාමුදුරුවෝ වෙනුවෙන් වෙහෙසුණු ආකාරය අපි හැමටම ආදර්ශයක්. ඒ බව මම මෙතනදී විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි.

හේමසාර ස්වාමීන් වහන්සේ ගුරුවරයකු හැටියට අම්පාර ප්‍රදේශයේ, ඒ වගේම දිඹුලාගල ප්‍රදේශයේ සේවය කළා. මහවැලිය හදන්න ගත්ත කාලේ මම ඔය පැත්තට යනවා. ඒ කාලේ හරි හමන් පාසල් තිබුණේ නැහැ. කැලේ තිබුණේ. ඒ පැත්තේ පාසලක උගන්වනවා කියන්නේ මහා පිංකමක්. එහෙම දුෂ්කර සහ වටිනා සේවාවක යෙදිලා තමයි උන්වහන්සේ කොළඹට එන්නේ. කොළඹට ඇවිත් පාසැල් කීපයකම අධ්‍යාපනය නගා සිටුවන්න උන්වහන්සේ ඇප කැපවීමෙන් කටයුතු කළා. ඒ වගේම විවේකාරාම විහාරස්ථානයේත්, මහරගම ශාසනාරක්ෂක බල

මණ්ඩයේ පමණක් නොව, සමස්ත ලංකා ශාසනාරක්‍ෂක බල මණ්ඩලයේත් වැඩ කටයුතු සඳහා වෙහෙසුණා. ඉදිරියටත් මෙවැනි සේවාවන් කරන්න උන්වහන්සේට දීර්ඝායුෂ ලැබේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා.

අද අපි මෙතැනට ආවේ අපේ ස්වාමීන් වහන්සේගේ සන්නස් පත්‍රය එහෙම නැත්නම් අක්ත පත්‍රය ප්‍රදානය කිරීමේ උත්සවයට සහභාගී වෙන්නයි. බස්නාහිර පළාතේ ප්‍රධාන සංඝනායක තනතුර පිරිනමමින් මේ අක්ත පත්‍රය පිරිනැමීමට තීරණ තීන්දු ගත්තේ සංඝ සභාවයි. ඒ සඳහා සාක්ෂි දරන්නේ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ ඇතුළු සංඝ සභාවයි.

පන්සලක් ඇති කළත්, විහාරයක් ඇති කළත්, එය කළ යුත්තේ සංඝ සභාව මගිනුයි. එයට සාක්ෂි දරන්නේ ලේඛකාධිකාරී ස්වාමීන් වහනසේ ඇතුළු සංඝ සභාවයි. අතීතයේ සිටම පැවත ආයේ මේ සම්ප්‍රදායයි. විහාරස්ථාන ඇති කිරීම, ඒවාට භික්‍ෂූන් වහන්සේලා යොමු කිරීම, විහාරාධිපති තනතුරු සඳහා සුදුස්සන් නම් කිරීම, නායක පදවි ලබා දීම ආදී සියළු කටයුතු සිදු කිරීමේ බලය ඇත්තේ ඒ ඒ සංඝ සභා වලටයි.

අප දන්නවා එදා වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ ස්වාමීන් වහන්සේ එදා එක එක ස්ථානවල විහාරස්ථාන ආරම්භ කරන්න ස්වාමීන් වහන්සේලා යෙදවූ ආකාරය. පැරණි කැළණි රජමහා විහාරස්ථානය යළි ආරම්භ කරන්න යෙදවූයේ මාපිටිගම පරපුරේ සංඝයා වහන්සේලායි. අමරපුර නිකාය, රාමඤ්ඤ නිකාය, අනෙක් පාර්ශව මෙන්ම අනු නිකායනුත් දිගටම අනුගමනය කළේ මේ පිළිවෙතයි. මේ සම්ප්‍රදායයි.

1815 වසරේ බ්‍රිතාන්‍යයන් සමග උඩරට ගිවිසුම ඇති කළ අවස්ථාවේදීවත් මේ සම්ප්‍රදාය වෙනස් කළේ නෑ. අපි ව්‍යවස්ථාවටත් මේ පිළිවෙත ඇතුළත් කරලයි තියෙන්නේ. නමුත් වර්තමානයේ මේ පිළිවෙත, මේ සම්ප්‍රදාය වෙනස් කිරීමට කෙටුම් පතක් සකස් කර තිබෙනවා. ඒ ගැන මේ සභාවේ සිටින දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාගේත්, බන්දුල ගුණවර්ධන ඇමැතිතුමාගේත් අවධානය යොමු කරන්න මම කැමතියි.

මෙම කෙටුම් පත අනුව විහාර හා දේවාල ගම් පණතේ 3 වෙනි වගන්තිය සංශෝධනය කර, අලුතෙන් උප වගන්ති දමා තියෙනවා. මේ කෙටුම් පත මගින් යෝජනා කරන්නේ බෞද්ධ කටයුතු කොමසාරිස් වෙනුවට, කොමසාරිස් ජෙනරාල් තනතුරක් ඇති කරන්නයි.

දැනට තියෙන බෞද්ධ කටයුතු කොමසාරිස් කියන තනතුර ඇති කළේ එක්සත් ජාතික පක්‍ෂයයි. ඒ තනතුර ඇති කරන්න තුන් දෙනෙක් මූලිකව කටයුතු කළා. ජේ ආර් ජයවර්ධන ජනාධිපතිතුමාත්, සංස්කෘතික අමාත්‍ය ඊ එල් බී හුරුල්ලේ මැතිතුමාත්, මමත්. ඒ තුන්දෙනාගෙන් අද ජීවතුන් අතර සිටින්නේ මම විතරයි. තායිලන්තයේ ආකෘතිය පදනම් කරගෙන මෙවන් ආයතනයක් හා තනතුරක් නිර්මාණය කළ යුතු බවයි මම යෝජනා කළේ.

ඒ අනුව 1978 දී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අධ්‍යක්‍ෂ යන නමින් හැඳින්වීම නොකළ යුතු බව ජේ.ආර්. ජයවර්ධන ජනාධිපති තුමා කිව්වා. මොකද ඒ නිලධාරියාට විධායක බලතල ලබා දීම සුදුසු නැති නිසා. ඒ නිලධාරියා වැඩ කටයුතු කළ යුත්තේ මහානායක ස්වාමීන් වහන්සේලාගේ අදහස් හා එකඟත්වයට යටත්වයි. ඒ නිසා මේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අධ්‍යක්‍ෂක වශයෙන් නොව කොමසාරිස් වශයෙන් හැඳින්විය යුතු බවට තීරණය කෙරුණා. මේ කොමසාරිස් මුලින්ම කටයුතු කළේ සංස්කෘතික අමාත්‍යාංශය යටතේ. පසුව බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ. දැන් ආණ්ඩුව ඉදිරිපත් කර තියෙන අලුත් කොටුම් පත අනුව, මේ කොමසාරිස් තනතුර කොමසාරිස් ජෙනරාල් වශයෙන් නම් කොට අලුත් බලතල රාශියක් ලබා දී තියෙනවා.

කෙටුම් පතේ පළමු උප වගන්තිය අනුව, විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ බලය බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාට පවරනවා. විහාරස්ථාන ලියා පදිංචි කිරීමේ නීත්‍යානුකූල බලයක් මේ නිසා කොමසාරිස් ජනරාල්වරයාට පැවරෙනවා. තුන්වැනි උපවගන්තිය යටතේ අවශ්‍ය තොරතුරු ඉල්ලා සිටින්නට කොමසාරිස් ජෙනරාල්වරයාට පුළුවන්. ඒ තොරතුරු ලබා

හතරවැනි උපවගන්තියට අනුව සහතිකයක් නිකුත් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට පුළුවන්.

එහෙම වුණාම සාක්ෂි ආඥා පනත යටතේ තිල සාක්ෂිය වෙන්නේ මේ සහතිකයයි. සංඝ සභාවේ ලේඛන, සන්නස් පත්‍ර, අක්ත පත්‍ර මොනවා තිබුණත්, ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ කුමක් කීවත්, නීත්‍යානුකූල ලේඛනය වෙන්නේ කොමසාරිස් ජනරාල්වරයා නිකුත්කරන සහතිකයයි. ඒ කියන්නේ විහාරස්ථානයක් පිළිබඳ තීරණ ගැනීමේ බලය සංඝ සභාවේ සිට, නැතිනම් ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේගේ සිට මේ බෞද්ධ කොමසාරිස් ජෙනරාල්වරයා කියන අලුත් තනතුරට පැවරෙන බවයි. එතකොට සංඝ සභාවේ තිබෙන බලතල නැති වෙනවා.

මේක සම්පූර්ණයෙන් අපේ සම්ප්‍රදාය, නීතිය පමණක් නොව ව්‍යවස්ථාව ද කඩ කිරීමක්. පන්සල් ලියාපදිංචි කිරීම මූලික බලතල තිබෙන්නේ සංඝ සභාවටයි. ආණ්ඩුව කළ යුත්තේ ආගමික ආයතන ලියාපදිංචි කිරීමේ බලතල තමන් වෙත පවරා ගැනීම නෙවෙයි. ආණ්ඩුව කළ යුත්තේ හැම නිකායකින්ම තොරතුරු හා සාක්ෂි රැගෙන විහාරස්ථාන ලේඛන ගත කිරීමයි. විහාරස්ථාන වේවා, අන්‍යාගමික දේවස්ථාන, කෝවිල් හෝ පල්ලි වේවා ඒවා පිළිබඳ තොරතුරු රැස් කොට ලේඛන ගතකිරීමත්, ඒවාට අවශ්‍ය උදව් උපකාර කිරීමත් ආණ්ඩුවේ යුතුකමක්.

නමුත් මේ කෙටුම් පත නීති ගත කරනවා නම් විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. කොමසාරිස් ජනරාල්වරයාට පුළුවන් කියන්න, පන්සලක් ඇති කරනවා නම්, විහාරාධිපති තනතුර පිරිනමනවා නම්, ප්‍රාදේශීය සභාවේ අනුමැතිය අවශ්‍යයි කියලා කියන්නත්. ඒ අනුව, පන්සලක් ඇති කරලා, සංඝයා වහන්සේ කෙනෙක් ඒකට යෙදවලා, කිසිම සංඝ සභාවකට අයිති නොවන පන්සල් ඇති කරන්නත් පුළුවන්. විහාරාධිපති ධුරයන්ට ප්‍රාදේශීය සභාවට හෝ කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය භික්ෂූන් වහන්සේලා නම් කරන්නත් පුළුවන්. එහෙම අවස්ථාවක නීතිය ඉදිරියට ගියොත් එතැනදී පිළිගැනෙන්නේ සංඝ සභාවේ හෝ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේගේ තීරණය හෝ මතය නෙවෙයි. සන්නස්

PRESIDENTIAL SECRETARIAT
LIBRARY



පත්‍රය හෝ අක්ත පත්‍රය නෙවෙයි. කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකයයි. ඒ නිසා මේ කෙටුම් පතේ තියෙන භයානකකම ගැන අප අවධානය යොමු කළ යුතුයි.

පන්සලක්, විහාරස්ථානයක් ලියාපදිංචි කරන බලතල සංඝ සභාවට නැතිව, නිලධාරියෙක් අතට ගියාම, ඒ නිලධාරියා ඉන්නේ අපේ මහනායක ස්වාමීන් වහන්සේලාට, අපේ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලාට ඉදිරියෙන්.

සංඝ සභාවේ බලතල ආණ්ඩුවේ නිලධාරීන් වෙත ලබා දීම සුදුසු නැහැ. එය සම්ප්‍රදාය බිඳ දැමීමක්. ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. අලුත් කෙටුම් පත නිසා, තියෙන බලතල ටිකක් සංඝ සභාවට නැති වන බව, මල්වත්තේ මහනායක ස්වාමීන් වහන්සේ සඳහන් කළේ මේ නිසයි. ඉතින් මේ ගැන අවධානය යොමු කර, මේ තත්වය වළක්වා ගත්තේ නැත්නම්, තව නොබෝ කලෙකින්, මෙවැනි නායක උත්සව වලදී, මහානායක ස්වාමීන් වහන්සේලා වෙතින් අක්ත පත්‍ර ලබා දීමක් වෙනුවට කොමසාරිස් ජනරාල්වරයාගේ ගැසට් පත්‍ර ලබා දීමක් අපිට දකින්නට හැකිවේවි. □

**බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත**

**දැනට ක්‍රියාත්මක පනතේ 3 වන වගන්තිය**

මෙම ආඥා පනතෙහි විධිවිධාන ශ්‍රී ලංකාවේ පිහිටි සෑම පන්සලකටම අදාළ වේ.

කෙසේ වුවද, අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියෝගයක් මගින් දළඳා මාළිගාව, ශ්‍රීපාදස්ථානය හා අටමස්ථානය හැර අන් කවර වූ හෝ පන්සලක්, පොදු යොමුවකින් හෝ අන් ආකාරයකින්, එහි එන විධිවිධාන සියල්ලෙහි හෝ ඉන් කවරක හෝ ක්‍රියාකාරීත්වයට යටත් වීමෙන් නිදහස් කළ හැක.

TAMAYIRUSU INTINSSITEPE YRARBIL

**නව කෙටුම්පතේ 3 වන වගන්තිය**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංකනය කිරීමෙන් ;

(2) එම උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් -

"(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති නිදහස් කිරීම් නොතකා ශ්‍රී ලංකාවේ සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් තුළම පිහිටා ඇති විහාරස්ථාන පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යාමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ පිහිටි සෑම විහාරස්ථානයක්ම (මෙහි මින්මතු "කොමසාරිස් - ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් - ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) අදාළ විහාරස්ථානයේ විහාරාධිපති විසින් ඉහත (2) වන උපවගන්තිය යටතේ අදාළ විහාරස්ථානය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන සියලු තොරතුරු කොමසාරිස් - ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය;

(4) (2) වන උපවගන්තිය යටතේ එසේ ලියාපදිංචි කිරීමෙන් පසු කොමසාරිස් - ජනරාල්වරයා විසින් එම ලියාපදිංචිය ස්ථිර කරමින් එම සෑම විහාරස්ථානයකම විහාරාධිපති වහන්සේ නමකට සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය."

PRESIDENTIAL SECRETARIAT
LIBRARY



## වෛතුල්‍යවාදය සහ වර්තමානය

*(2014 ජුනි 29 වන දා ගාල්ලේ දී පැවැත්වූ කතාව)*

ලෝකයේ විවිධ ආගම් තිබෙන අතර, සෑම ආගමකම සුළු පිරිසක් අන්තවාදයට යන අතර, තවත් කොටසක් ත්‍රස්තවාදයට යනවා. මේ අය මෙසේ අන්තවාදී ලෙස කටයුතු කිරීම සහ ත්‍රස්තවාදී ක්‍රියා සිදු කිරීම ආගමික සංහිඳියාවට විශාල ප්‍රශ්නයක් වෙලා.

ඉස්ලාම් ආගමේ සුළුතරයක් අන්තවාදයට සහ ත්‍රස්තවාදයට නැඹුරුව ක්‍රියා කරන අතර, මේ තත්ත්වය ශ්‍රී ලංකාවේ වගේම ලෝකයේද ප්‍රශ්නයක් බවට පත්ව තිබෙනවා. නමුත් මුස්ලිම් ජනතාවගෙන් බහුතරය එසේ අන්තවාදීව සහ ත්‍රස්තවාදීව ක්‍රියා නොකරන අතර, ඒ අය සාමාන්‍ය පරිදි ජීවත් වනවා. එමෙන්ම ශ්‍රී ලංකාවේ බෞද්ධයින් අතරින් ද ඉතාම සුළු කොටසක් ආගමික අන්තවාදයට අනුව ක්‍රියා කරන බව කිව යුතුයි.

මේ ප්‍රශ්න විසඳා ගත හැක්කේ නිවාස කඩා ගිනි තබා පහරදී මිනිස් ජීවිත අහිමි කිරීමෙන් නොව විවෘතව සාකච්ඡා කර ආගමික සංහිඳියාවක් ගොඩනගා ගැනීමෙනුයි. සිංහල සහ මුස්ලිම් බහුතරයට අවශ්‍ය වන්නේ සහෝදරත්වයෙන් සහ සමගියෙන් යුතුව එකට ජීවත්වීමටයි.

තෙරුන් වහන්සේලාගේ ධර්මය පදනම් කර ගත් බුදු දහමට සහ මහා විහාරයීය සිරිතට වර්තමානයේ තිබෙන විශාලතම ප්‍රශ්නය, අභියෝගය සහ තර්ජනය වන්නේ ඒකාධිපති රාජපක්ෂ රෙජිමය ඇති කර තිබෙන වෛතුල්‍යවාදයයි.

මේ රටේ බුදු දහම කියන්නේ මහායාන බුදු දහම හෝ වජ්‍රයාන

බුදු දහම නොව තෙරුන් වහන්සේලාගේ ධර්මයයි. මාතලේ අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරමින් අප ථෙරවාදී බුදු දහම ආරක්ෂා කළා. චීන, ටිබෙට්, ජපන්, භූතාන, ලඩක්, බුරුම, තායි, කාම්බෝජියා, ලාඕස්, වියට්නාම්, කොරියානු භාෂාවන්ට ඒ ග්‍රන්ථ මේ වන විට පරිවර්තනය වී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ අප එදා ඒ ධර්මය ආරක්ෂා කිරීමට ගත් පියවර නිසයි.

පළමුවෙන්ම බුදු දහම ආරක්ෂා කර වර්ධනය කිරීමට බැඳී සිටි රජවරුන්ගේ මූලික වැඩ කටයුත්ත වූයේ තෙරුන් වහන්සේලාගේ ධර්මය ආරක්ෂා කිරීමයි. කෙසේ නමුත් විවිධ ආගම්වලින් ඒ කාලයේ ප්‍රශ්න ඇති වුණත් අප ඊට මුහුණ දුන්නා. පෘතුගීසින් අපේ පන්සල් සහ ඒ පන්සල්වල පිහිටි දේවාල ඇතුළු සියල්ල ද මුස්ලිම් පල්ලිද එදා කඩා විනාශ කළා. පෘතුගීසීන් පන්නා දැමීමෙන් පසුව ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශයේ සිටි කතෝලික භක්තිකයන්ට සිය ආගම ඇදහීම සඳහා අවස්ථාව ලබා දෙමින් ජෝසප් වාස් පියතුමාට රැකවරණය ලබා දුන්නේ අපේ උඩරට රජ්ජුරුවෝයි.

අපේ වෙහෙර විහාරස්ථාන කඩා විනාශ කළා යැයි කියමින් ඒ භක්තිකයන්ට හිරිහැර නොකළ අප උපරිම රැකවරණය සහ ආරක්ෂාව ලබා දුන්නා. අප අපේ වෙහෙර විහාරස්ථාන නැවත ගොඩනගමින් බෞද්ධ සහ හින්දු ප්‍රබෝධයක් රටේ ඇති කිරීමට කටයුතු කළා. වෙසක් පොහෝ දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස නම් කරන ලෙසට ව්‍යවස්ථාදායක මණ්ඩලයට එදා යෝජනා කළේ පොන්නම්බලම් රාමනාදන් මැතිතුමායි.

මෙයින් පැහැදිලි වන්නේ අප අතර තිබූ ආගමික සංහිඳියාවයි. ඒ සියලු ගුණධර්ම අපට හිමි වූයේ තෙරුන් වහන්සේලාගේ ධර්මයෙන් සහ මහා විහාර සිරිතෙන් වන නිසා ඒ ධර්මය අප ආරක්ෂා කළ යුතුයි.

සියම් මහා නිකායේ මල්වතු සහ අස්ගිරි පාර්ශ්වවල ද, අමරපුර මහා නිකායේ ද, රාමඤ්ඤ මහා නිකායේ ද සිරිත අනුව මහා නා හිමිවරුන් වැඩ කටයුතු කරන්නේ විනය පිටකයට අනුව කාරක සංඝ සභා මාර්ගයෙනුයි.

රජය, බෞද්ධාගමික වැඩ කටයුතු මහා සංඝයා වහන්සේලාටත්, ඉස්ලාම් ආගමික වැඩ කටයුතු ඒ ආගමික ප්‍රධානීන්ටත්, හින්දු ආගමික වැඩ කටයුතු ඒ ආගමික ප්‍රධානීන්ටත්, ක්‍රිස්තියානි ආගමික වැඩ කටයුතු ඒ ආගමික ප්‍රධානීන්ටත් පැවරිය යුතුයි.

සමහරවිට ආණ්ඩුවක් යම් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා අවස්ථාවේදී මහා නා හිමිවරුන් ඇතුළු අනෙකුත් ආගමික ප්‍රධානීන් ඊට විරුද්ධ අදහස් සහ යෝජනා ඉදිරිපත් කරනවා. එංගලන්තයේ ඩේවිඩ් කැමරන් අග්‍රාමාත්‍යවරයාට විරුද්ධව එරට ප්‍රොතෙස්තියානු ආගමේ ප්‍රධානියා වන අග්‍ර රාජගුරු හිමිපාණන් වහන්සේ ප්‍රකාශයක් කළා. නමුත් රජය ඒ ප්‍රතිපත්තිමය තීන්දු ගෙන ක්‍රියාත්මක කරන බව ඩේවිඩ් කැමරන් අග්‍රාමාත්‍යවරයා ද පැහැදිලිව ප්‍රකාශ කර තිබුණා.

අපේ රටේ ද සෑම ආණ්ඩුවකටම එවැනි ප්‍රශ්නවලට මුහුණදීමට සිදුවුණා. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාත්, අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියත්, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියත් එවැනි තත්ත්වයන්ට මුහුණ දුන්නා.

එවැනි අවස්ථාවකදී ඒ නායකයින් සියලු දෙනාම කළේ සිය ස්ථාවරය සහ ප්‍රතිපත්තිය පැහැදිලිව ප්‍රකාශ කර සාකච්ඡා මාර්ගයෙන් ඒ ප්‍රශ්න විසඳා ගැනීමයි. අප කවුරුවත් මහා සංඝ රත්නයේ සහ ඒ ඒ නිකායන්වල වැඩ කටයුතුවලට ඇඟිලි ගැසුවේ නැහැ.

මගේ යෝජනාවකට අනුව ජේ.ආර්. ජයවර්ධන මහතා බෞද්ධ කටයුතු කොමසාරිස් දෙපාර්තමේන්තුව ආරම්භ කළා. ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා පසු කාලීනව බුද්ධශාසන අමාත්‍යංශය ඇති කළා. එසේ කටයුතු කළ ඒ නායකයින් මහා නා හිමිවරුන්ගේ අවවාද සහ අනුශාසනා පිළිගෙන ඒ අනුව ක්‍රියා කළා.

නමුත් ඒකාධිපති රාජපක්ෂ රෙජිමය මේ මහා නා හිමිවරුන් ප්‍රධාන මහා සංඝරත්නය ද අනෙකුත් සර්වාගමික නායකයින් ද දකින්නේ සිය පාලනයට තර්ජනයක් ලෙසයි. ඊට හේතුවී තිබෙන්නේ මහා නා හිමිවරුන් සහ කාරක සංඝ සභා මත් කුඩු

PRESIDENTIAL SECRETARIAT
LIBRARY



ජාවාරමට, කැසිනෝ ව්‍යාපරයට සහ දූෂණයට එරෙහිව සෘජුව කතා කරමින් ප්‍රජාතන්ත්‍රවාදයත්, මානව අයිතිවාසිකමුත්, නීතියත් තහවුරු කරන ලෙසට ආණ්ඩුවට අවධාරණය කර බුදු දහම මතක් කර දීමයි. එමෙන්ම අනෙකුත් ආගමික නායකයින් ද මේ කාරණා ගැන සෘජුව සිය අදහස් සහ යෝජනා ඉදිරිපත් කරමින් සිටිනවා.

මේ තත්ත්වය සිය බලය තහවුරු කර ගැනීමට ඒකාධිපති රාජපක්ෂ රෙජිමයට විශාල අභියෝගයක් වන නිසා මුලින්ම කළේ 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර ස්වාධීන කොමිෂන් සභා සියල්ල අක්‍රිය කිරීමයි. ඊට සමගාමීව ජනමාධ්‍යවේදීන් ඝාතනය කිරීම, ජනමාධ්‍ය ආයතන ගිනි තබා විනාශ කිරීම, ජනමාධ්‍යවේදීන්ට පහරදී තර්ජනය කිරීම ආදී ක්‍රියාමාර්ග ඔස්සේ ජනමාධ්‍ය සම්පූර්ණයෙන්ම මර්දනය කළා. පොලිසිය දේශපාලන ග්‍රහණයට ගත් රෙජිමය පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් බිය ගැන්නුවා. ශිරාණි බණ්ඩාරනායක මහත්මිය අගවිනිසුරු ධූරයෙන් පහකර අධිකරණය සම්පූර්ණයෙන්ම අඩපණ කළා.

ජනතා විමුක්ති පෙරමුණ ආදී සමහර දේශපාලන පක්ෂ දෙකඩ කළ ඒකාධිපති රෙජිමය එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් කොටසක් ඩැහැ ගත්තත් අප වැටුණේ නැහැ. පාර්ලිමේන්තුවේදී මහජන නියෝජිතයින් රටත් ජනතාවත් වෙනුවෙන් අසන ප්‍රශ්නවලට රාජපක්ෂ රෙජිමය පිළිතුරු ලබා දෙන්නේ නැහැ.

සිය පාලනයට සහ පැවැත්මට බාධාවක් වන සෑම ආයතනයක්ම, අංශයක්ම සහ බලවේගයක්ම අඩපණ කළ ඒකාධිපති රෙජිමයට ඊළඟට තිබුණු විශාලතම බාධාවත්, අභියෝගයත්, ප්‍රශ්නයත් වූයේ අපේ මහා නා හිමිවරුන් ප්‍රධාන මහා සංඝරත්නයයි.

බුද්ධ ශාසන අමාත්‍යංශය ඒකාධිපති රෙජිමයේ දේශපාලන ආයතනයක් බවට පත් කර ගෙන තිබෙන අතර, එම අමාත්‍යංශය යටතේ ප්‍රතිපාදන ලබා දෙන්නේ ඒ අය සමග සිටින භික්ෂූන් වහන්සේලා සුළු පිරිසකට පමණයි.

PRESIDENTIAL SECRETARIAT LIBRARY



මෙසේ ක්‍රියා කරමින් ඒ භික්ෂූන් වහන්සේලා ආණ්ඩුව පැත්තට හරවා ගන්නවා කියන්නේ ඒ භික්ෂූන් වහන්සේලා කාරක සංඝ සභාවලින් සහ මහා නා හිමිවරුන්ගෙන් වෙන් කිරීමයි.

මහා සංඝරත්නය කටයුතු කරන්නේ සියම් මහා නිකායේ මල්වතු සහ අස්ගිරි කාරක සභා, අමරපුර මහා නිකායේ කාරක සභා සහ රාමඤ්ඤ මහා නිකායේ කාරක සභා යටතේයි. ඒ අනුව ආණ්ඩුව මේ උත්සාහ කරන්නේ මේ භික්ෂූන් වහන්සේලා ඒ කාරක සභා පාලනයෙන් ඈත් කිරීමටයි.

එදා සිට මේ දක්වා මේ රටේ ජනාධිපතිවරුන් උපදෙස්, අවවාද සහ අනුශාසනා ලබා ගත්තේ මහා නා හිමිවරුන්ගෙනුයි. ජනාධිපතිවරයාට උපදෙස් ලබා දීමට අපේ මහා විහාර සිරිත අනුව මහා නා හිමිවරුන් සිටියදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නිල උපදේශකයින් ලෙස වෙනත් භික්ෂූන් වහන්සේලා සිටින්නේ ඇයි? එක් ජනාධිපති නිල උපදේශක භික්ෂූන් වහන්සේ නමක් පළාත් සභා මැතිවරණයේ දී ආණ්ඩු පක්ෂයෙන් මැතිවරණ අපේක්ෂකයෙක් ලෙසත් ඉදිරිපත් වුණා. ජනාධිපති නිල උපදේශකයින් ලෙස මෙසේ භික්ෂූන් වහන්සේලා පත් කර ගන්නේ මහ නාහිමිවරුන් නොසලකා හැර කාරක සංඝ සභාවලින් ඉටු විය යුතු කාර්යයන් ආණ්ඩුව අතට ගෙන ඒ මාර්ගයෙන් භික්ෂූන් වහන්සේලා ආණ්ඩුව පැත්තට නම්මවා ගැනීමටයි.

ජනාධිපති උපදේශකයින් ලෙස මේ භික්ෂූන් වහන්සේලා පත් කර ගෙන සිටින්නේ මහා නා හිමිවරුන්ගේ අනුමැතිය සහ උපදෙස් ඇතිව ද? රටේ නායකයාට උපදෙස් දීමට මහා නා හිමිවරුන් සිටින නිසා සිය නිල උපදේශකයින් ලෙස වෙනත් භික්ෂූන් වහන්සේලා පත් කර ගැනීමට ජනාධිපතිවරයාට හැකියාවක් ඇත්තේ නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ භික්ෂු පෙරමුණක් තිබෙනවා නම් ඒ භික්ෂූන් වහන්සේලා සමග සිය පක්ෂයේ වැඩ කටයුතු ගැන කතා කළ හැකියි. එසේ නොමැතිව මේ ආකාරයට ජනාධිපති උපදේශකයින් ලෙස භික්ෂූන් වහන්සේලා පත් කර ගෙන මහා සංඝ රත්නය අඩපණ කිරීම අපේ මහා විහාර සිරිතට සම්පූර්ණයෙන්ම

විරුද්ධයි.

සංඝාධිකරණ ආදී කටයුතු ගැන අපේ මහා නා හිමිවරුන් යෝජනා ඉදිරිපත් කරමින් ඉල්ලීම් කළත් ඒ සියල්ල පසෙක තබා මේ ඒකාධිපති රෙජිමය කරන්නේ අපේ මහා විහාර සම්ප්‍රදාය සම්පූර්ණයෙන්ම අඩපණ කිරීමයි.

අපේ බෞද්ධ සිද්ධස්ථාන අතර මුදුන්මල්කඩ මහනුවර ශ්‍රී දළදා මාළිගාවයි. අපට වැදගත්ම පෙරහර වන්නේ ද ශ්‍රී දළදා පෙරහරයි. එබඳු පුදබිමක් අවට රාත්‍රී කාර් රේස් පැවැත්වීම කිසිසේත් ම යෝග්‍ය වන්නේ නැහැ. විශේෂයෙන් ශ්‍රී දළදා පෙරහර පැවැත්වෙන කාල වකවානුව ආසන්නයේ ශ්‍රී දළදා මාළිගාව අවට තබා මහනුවර පුරවරයේවත් කාර් රේස් පැවැත්වීම අනුමත කළ නොහැකියි.

නමුත් ඒ කිසිවක් නොතකා රෙජිමය ඒ ප්‍රදේශයේ රාත්‍රී කාර් ධාවන තරග පැවැත්වීමට සැලසුම් කළා. ඒ ගැන අපේ මහා නා හිමිවරු විරෝධය පළ කළා. මෙවැනි අවස්ථාවකදී ඒ කාරක සංඝ සභාව කියන දේ ආණ්ඩුව ඇසිය යුතුව තිබුණා. එහෙත් ඒ කිසිවක් තුට්ටුවකට මායිම් නොකර රෙජිමය මහනුවර ශ්‍රී දළදා මාළිගා පුදබිම අවට දළදා පෙරහර පැවැත්වෙන කාල වකවානුව ආසන්නයේ තමන්ට අවශ්‍ය පරිදි රාත්‍රී කාර් රේස් තරග පවත්වා විනෝද වුණා.

පාප් වහන්සේට නමස්කාර කිරීම සඳහා නත්තල් දිනයේදී කතෝලිකයින් විශාල පිරිසක් රෝමයට පැමිණෙනවා. නමුත් රෝමයේ ආණ්ඩුව ඒ අවස්ථාවේදී රෝමය වටා රාත්‍රී කාර් ධාවන තරග පවත් වන්නේ නැහැ. ලොව පුරා මුස්ලිම් ජනයා මක්කම වැඳ පුදා ගැනීමට පැමිණෙන විට සෞදි ආණ්ඩුවද මක්කම වටේ එවැනි කාර් ධාවන තරග පවත් වන්නේ නැහැ. එමෙන්ම හින්දු බැතිමතුන් විශාල වශයෙන් වරනාසිවලට පැමිණෙන කාලයේදී ඉන්දියානු ආණ්ඩුව ද ඒ ප්‍රදේශයේ රාත්‍රී කාර් ධාවන තරග පවත් වන්නේ නැහැ.

එසේ තිබිය දී ඒකාධිපති රෙජිමය මහනුවර ඇසළ පෙරහර පැවැත්වෙද්දී රාත්‍රී කාර් ධාවන තරග ඒ ප්‍රදේශයේ පවත් වන්නේ

මහා විහාර සිරිත කඩා කප්පල් කිරීමේ වෛතුල්‍ය වාදී ක්‍රියාවක් ලෙස බව කිව යුතුයි. මහා විහාර සිරිත අඩපණ කිරීමේ වෛතුල්‍ය වාදී ක්‍රියාකාරකම් කිරීම සඳහා ඒකාධිපති රෙජිමය විවිධ සංවිධාන ද ගොඩනඟා ගෙන තිබෙනවා.

බේරුවල මුස්ලිම් කඩය ගිනි තබා විනාශ කළ අවස්ථාවේදී සහ අපේ භික්ෂූන් වහන්සේ නමකට හිරිහැර කළ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් විධිමත් සහ සාධාරණ පරීක්ෂණයක් කර අවශ්‍ය පියවර ගන්නා අතර, කන්දේ විහාරය සහ අපේ තීනියාවල පාලිත හිමියන්ගේ පන්සල ඇතුළු ප්‍රධාන පෙළේ විහාරස්ථානවල නායක හිමිවරුන් ද මුස්ලිම් පල්ලියේ පූජකයින් ද අවශ්‍ය නම් ක්‍රිස්තියානි පල්ලියේ පූජකයින් ද සිංහල සහ මුස්ලිම් ජනතා ප්‍රධානින් ද කැඳවා මේ ප්‍රශ්නය විසඳීමට ඒ අයට භාර දුන්නා නම් අලුත්ගම සහ බේරුවල මේ ගැටුම්කාරී තත්ත්වය ඇති වන්නේ නැහැ.

අපේ සාම්ප්‍රදායික සිරිත අනුව ඒ සර්වාගමික නායකයින්ගේ සහයෝගය, උදව් සහ උපදෙස් නොගෙන මේ අය කළේ බොදු බල සේනාව අලුත්ගමට එවීමයි. බොදු බල සේනාව මෙසේ පිටස්තරින් අලුත්ගමට එව්වේ මහා විහාර සිරිත කැඩීමටයි. සියම් මහා නිකායේ මල්වතු සහ අස්ගිරි පාර්ශ්ව ද අමරපුර නිකාය ද රාමඤ්ඤ නිකාය ද නොතකා බොදු බල සේනාව එව්වේ මහා විහාර සිරිත කඩා අලුත් බලවේගයක් ගොඩනැගීමටයි. බොදු බල සේනාව අලුත්ගමදී එදා ඒ කළ කතා බෞද්ධ කතා නොව කුණුහරුප සහ ත්‍රස්තවාදී කතා බව කිව යුතුයි.

එදා තෙරුන් වහන්සේලාගේ ධර්මයට එරෙහිව මතු වූ වෛතුල්‍යවාදය පවා කතා කළේ මහායානය සහ ඒ දහමේ තිබෙන දියමන්ති සූත්‍රය, පද්ම සූත්‍රය ආදී සූත්‍ර ගැන මිසා කුණුහරුප නොවෙයි. එදා වාද කෙරුණේ ථෙරවාදී සූත්‍ර සහ මහායාන සූත්‍ර ගැනයි. නමුත් අලුත්ගමදී බොදු බල සේනාව කතා කළේ සූත්‍ර ගැන නොව කුණුහරුපයි.

මේ බලවේගය මුලින්ම ගොඩනැගුවේ සිරිකොත එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයට පහරදීම සඳහා වන අතර, ආරක්ෂක අංශවල

සහයෝගය ඇතිව බොදු බල සේනාව එදා සිරිකොතට කඩා වැදුණා. මේ අවස්ථාවේදී මේ අය අලුත්ගමට පැමිණියේද ආණ්ඩුවේ කොටසකගේ සහයෝගය ඇතිවයි. මේ අය මෙසේ ක්‍රියා කළේ අලුත් බලවේගයක් ගොඩනඟා මහා නායක ස්වාමීන් වහන්සේලා සහ කාරක සභා සතු බලය උන්වහන්සේලාගෙන් උදුරා ගැනීමටයි. නමුත් මේ අය නොසිතූ ආකාරයට මේ ක්‍රියාවලිය විශාල ප්‍රශ්නයක් සහ ගැටුමක් බවට පත්ව අතේ පත්තු වුණා.

වෛතුල්‍යවාදියෙකු වූ සංඝමිත්ත ස්වාමීන් වහන්සේ එදා මහසෙන් රජතුමාගේ පාලනය යටතේ මහා විහාරයට විරුද්ධව විශාල වැඩ සටහනක් ආරම්භ කළා. මහා විහාරයට විරුද්ධ මේ වැඩ කටයුතු සඳහා උන්වහන්සේට උදව් කිරීමට සෝණ ඇමැතිවරයා ද එක් වුණා. මේ අය එකතු වී මහා විහාරයේ භික්ෂූන් වහන්සේලාට දානය ලබා දීම සම්පූර්ණයෙන්ම තහනම් කළා. දානය නොමැති නිසා සමහර භික්ෂූන් වහන්සේලා රුහුණට ද තවත් අය මලේ ප්‍රදේශයට ද ඇතැම් භික්ෂූන් වහන්සේලා කඳුකරයට ද වැඩම කළ අතර, තවත් භික්ෂූන් වහන්සේලා ඉන්දියාවට වැඩම කළා.

ඒ අවස්ථාවේදී වහාම රැස්වූ මහා විහාරයීය භික්ෂූන් වහන්සේලා දානය ලබා ගැනීම වෙනුවෙන් මහා විහාර සිරිත කිසිසේත් පාවා නොදී දානය නොගෙන මහා විහාර සිරිත දැඩිව ආරක්ෂා කිරීමට තීරණය කළා.

වෛතුල්‍යවාදීන් එදා මහා විහාරයීය භික්ෂූන් වහන්සේලාට මහ මගදී පහරදී පන්නා දැමූ අතර, පුරා අවුරුදු නවයක් මහා විහාරය නොමැතිව තිබුණා. ඒ අවස්ථාවේදී සංඝමිත්ත භික්ෂූන් වහන්සේ සහ සෝණ ඇමැතිවරයා ගොස් මහා විහාරය කඩා විනාශ කර ඒ කොටස් අභයගිරියට දී ඒ භූමියේ ජෙතවනාරාමය ගොඩනැගුවා. ජේතවනාරාම දාගැබ සමග විහාරයක් සහ පිරිවනක් ද ඉදිකිරීමට මේ අය කටයුතු කළා.

කෙසේ නමුත් මේ ක්‍රියාවට එරෙහිව රටේ ජනතාව ද අවසානයේදී මහසෙන් රජතුමාගේ ඇමැතිවරුන්ගෙන් කොටසක් ද නැගී සිටියා. මේඝවන්න අභය ඇමැතිවරයා විශාල හමුදාවක් රැස් කළ අතර, ඒ හමුදාව සමග සටන් කිරීමට නොහැකි බව මහසෙන්

රජතුමා තේරුම් ගත්තා. මේ අය කළ එකම ඉල්ලීම වූයේ මහා විහාරය යළි ගොඩනැගිය යුතු බවයි.

මේ අතර, ථූපාරාමය කඩා විනාශ කිරීමට ගිය සංඝමිත්ත භික්ෂූන් වහන්සේ අල්ලා ගත් ජනතාව උන්වහන්සේ මරා දැමුවා. තවත් කට්ටියක් ගොස් සෝණ ඇමැතිවරයාව මාලිගාවෙන් ඇද එළියට ගෙන එල්ලා මරුමුවට පත් කළා. තවත් ඇමැතිවරයකු මේ සිද්ධීන් සම්බන්ධයෙන් විභාගයක් කර ජේතවනාරාමය භාරව සිටි කොහොන් තිස්ස භික්ෂූන් වහන්සේ විනය සහ නීතිය කඩකර තිබූ නිසා උන්වහන්සේ ශාසනයෙන් නෙරපා දැමූවා. අවසානයේදී සිය මුදලින්ම මහා විහාරය යළි ගොඩනැගීමට මහසෙන් රජතුමා එකඟ වුණා. ඒ සමගම මහා විහාරයට එරෙහි වෛතුල්‍යවාදය සම්පූර්ණයෙන්ම පරාජයට පත් වුණා.

මේ වත්මන් ආණ්ඩුව යටතේ ද සංඝමිත්ත භික්ෂූන් වහන්සේලා, කොහොන් තිස්ස භික්ෂූන් වහන්සේලා සහ සෝණ ඇමැතිවරු ආදී පිරිසක් මතු වී සිටිනවා. එසේ නම් අපේ යුතුකම වගකීම සහ කාර්ය භාරය වන්නේ ඒකාධිපති රාජපක්ෂ රෙජිමයත්, ඒ අයගේ වෛතුල්‍යවාදයත් අවසන් කොට මහා විහාර සිරිත ආරක්ෂා කිරීමයි. □

# මහින්ද චින්තනය

*(2014 පොසොන් පොහෝදා ලංකාදීප පත්‍රයේ පොසොන් අතිරේකය වෙනුවෙන් ලියූ ලිපියකි.)*

අද පොසොන් පොහොය දිනයයි.

ඉන්දියාවේ සාරානාත්හි දී බුදුන් වහන්සේ විසින් දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරනු ලැබීමෙන් ඉනික්බිතිව ප්‍රාරම්භ වී ලොව පතළ වූ බුදු දහම අරහයා උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව සිදු වූ අතිශය ප්‍රබල වූ ද, තියුණු වූ ද, තීරණාත්මක වූ ද, ඓතිහාසික සාධකය මෞර්ය රාජවංශික අශෝක අධිරාජ්‍යයාගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූත කණ්ඩායමේ අද වැනි දිනක සිදු වූ ලංකාගමනය යයි මම විශ්වාස කරමි. ආපසු ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ වූ ඒ සිදුවීම දෙස ආපසු හැරී බලන කල එම තනි ක්‍රියාව නිසා ථෙරවාදී බුදු දහම ලොව ආරක්ෂා වූ බව පෙනී යයි.

මහා පරිනිර්වාණයෙන් පසුව බුදු දහම අනාගතය සඳහා ආරක්ෂා කර ගැනීමේ අරමුණින් බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ශ්‍රාවකයන් 500 නමක් එක්ව සංඝායනාවක් පවත්වන ලදී. එමගින් කට පාඩමට තිබූ ධර්ම කොටස් මුඛ පරම්පරාගතව ඉදිරියට ගෙන යාමට වෑයම් කරන ලදී. මෙසේ ඉදිරියට ගෙන එනු ලැබූ ධර්මය තෙරුන් වහන්සේලාගේ ධර්මය නමින් හැඳින්විණි. වසර 100 කට පසුව පවත්වන ලද දෙවන සංඝායනාවේදී විනය පිටකයේ යම් යම් කොටස් වෙනස් කිරීමට යෝජනා වුව ද බහුතර සම්ප්‍රදායානුකූල සංඝයා වහන්සේලා මේ යෝජනාවට විපක්ෂ වූ බැවින් එම යෝජනාව ගෙන ආ භික්ෂූන් වහන්සේලා වෙන්ව ගොස් මහා සංඝිකය හිටුවා ගත්හ. තුන්වන සංඝායානාව ක්‍රිස්තු පූර්ව 269 දී මෞර්ය අධිරාජ්‍යයේ පාලනය බාරගත් අශෝක අධිරාජයාගේ කාලයේ දී කැඳවන ලදී. මෙහිදී පළමු

වන සංඝායනාවේ පටන් ශිෂ්‍ය මුඛ පරම්පරාගතව ඉදිරියට ගෙන එනු ලැබූ තෙරුන් වහන්සේලාගේ ධර්මය පිළිගෙන පිරිසිදු කොට අනුමත කරනු ලැබීය. ථෙරවාද බුදු දහම ලෙස හැඳින්වූයේ මෙම පිරිසිදු ධර්මයයි. මෙම ධර්මය උතුරු ඉන්දියාවෙන් ඔබ්බට පැතිරවීම සඳහා ධර්ම දූතයන් පිටත් කර හැරීමට අශෝක අධිරාජ්‍යයා තීරණය කළ අතර ඒ අනුව අප අද සිහි කරන ඒ ඓතිහාසික සිදුවීමට මග පෑදිණි.

ඒ වන විට ථෙරවාද ධර්මය මුල් කර ගත් හීනයාන නිකායන් 18 ක් ඉන්දියාවේ පැවැති අතර කාලයාගේ ඇවෑමෙන් ඒවා විවිධ විපර්යාසයන්ට ගොදුරු වෙමින් ද, හීන වෙමින් ද යටපත් වී නොපෙනී ගියේය. එහෙත් එකල ධර්ම දූත මෙහෙවරට වැඩි මිහිඳු මහ රහතන් වහන්සේට ආශ්‍රමයක් තනනු පිණිස පූජා කරනු ලැබූ මහ මෙව්නා උයන ඇසුරෙන් බිහි වූ මහා විහාරය ථෙරවාද ධර්ම ප්‍රචාරක කේන්ද්‍රස්ථානයක් වශයෙන් ලොව පුරා ප්‍රසිද්ධියට පත්විය. බුරුමය, කාම්බෝජය, ලාඕසය වැනි අග්නිදිග ආසියානු රටවලට ථෙරවාදී බුදු දහම ලෙස මෙරට මහා විහාරීය ථෙරවාද බුදු දහම ව්‍යාප්ත විය.

ථෙරවාදී බුදු දහම සමග මෙරටට සම්ප්‍රාප්ත වූ අශෝක සිරිත අනුරාධපුර යුගයේ දේශපාලන හා සමාජ ව්‍යුහය තුළ මුල්බැස ගත්තේය. මහා ඇලෙක්සැන්ඩර් රජු පරාජයට පත් කර චන්ද්‍රගුප්ත රජුගෙන් ආරම්භ වූ මෞර්ය අධිරාජ්‍යයේ සමාජ ආර්ථික දේශපාලන හරය කෞටිල්‍ය, චාණක්‍ය, විෂ්ණුගුප්ත ආදී ශූර හා කපටි බ්‍රාහ්මණ විශේෂඥයන්ගේ ගුරු උපදේශ මත පිහිටුවනු ලද නමුත් අශෝක රජු ස්වකීය අධිරාජ්‍යයේ සමාජ ආර්ථික හා දේශපාලන හරය බුදු සමයේ එන ගුණ දහම් අනුව පිහිටුවීය. හිංසාව වෙනුවට කරුණාව යොදා ගත්තේය. දැඩි අධිකරණය ලිහිල් කළේය. සියලු වැසියන් තම දරුවන් බව පැවසීය. එකල පැතිර යමින් තිබූ සත්ව යාග හෝම අඩු තරමින් තම අගනුවරට සීමා කරමින් අවිහිංසාවට අනුබල දුන්නේය. ඇතැම් සතුන් මැරීම සහමුලින්ම තහනම් කළේය. ආහාරය සඳහා සතුන් මැරීම වුව ද පාලනයට ලක් කළේය. සෙවන හා ආහාර පිණිස මග දෙපස පළතුරු ගස් සිටවීය. ළිං තැනවීය. බෙහෙත් පැලැටි වවා මිනිසුන්ට මෙන්ම සතුන්ට ද සැපයීය. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියා

සිදුකිරීමටත්, සොයා බැලීමටත් "ධර්ම මහා මාත්‍ර" හෙවත් ධර්ම නිලධාරී නමින් නිලධාරී පන්තියක් ඇති කළේය.

ඔහු බුදු දහම තරයේ අනුගමනය කළත් අනෙක් ආගම්වලට ද ඉඩ ප්‍රස්ථා සැපයීය. සෑම ආගමක්ම පූජනීය බව නිතර පැවසීය. බෞද්ධාගමේ ප්‍රධාන ප්‍රතිවාදී ආගමක් ලෙස සැලකෙන ආජීවක නිකායට ඔහු කෘතිම ලෙන් සතරක් තනවා පූජා කළේය. ඒ අතරම බෞද්ධාගම නිසි පරිදි පවත්වා ගෙන යාමට අවශ්‍ය රාජ්‍යමය මාර්ගෝපදේශ ලබා දුන්නේය. මහා සංඝයා වහන්සේ විසින් පිළිපැදිය යුතු ධර්ම කරුණු ක්‍රියාත්මක කිරීමට පසුබට නොවීය. නොනිසි සේ හැසිරුණු බෞද්ධ භික්ෂූන් වහන්සේ සිවුරු හරවන ලෙස ප්‍රාදේශීය නිලධාරීන්ට උපදෙස් දුන්නේය. කාලයාගේ ඇවෑමෙන් බුදු දහම චාම් ඉන්දියානු ආගමක් ලෙස පැවතීම නැවතී ජගත් ආගමක් බවට පත්වීමේ මාර්ගයට ප්‍රවේශ වූයේ අශෝක රජුගේ කාලයේදීය. ඔහුගේ අභාවයත් සමග මෞර්ය අධිරාජ්‍යය බිඳවැටුණි. ඉන්දියානු ඉතිහාසය තුළ අශෝක රජු සඳහන් වන්නේ ධාර්මික වූ, විභූතිමත් මහේශාක්‍ය රජ කෙනෙකු ලෙසය. ඉන්දියානු රජය තම රාජ්‍ය මුද්‍රාව සඳහා අශෝක රජු විසින් පිහිටුවන ලද ස්තම්භයක එන මුද්‍රාව යොදා ගැනීමෙන්ම එම මෞර්ය සිරිතෙහි අගය හා අභිමානය පිළිබිඹු වෙයි.

බුදු දහමත්, අශෝක සිරිතත් ස්වකීය සම්ප්‍රදාය බවට පත් කර ගත් අප ශිෂ්ඨාචාරය ඊට අනුකූලව පිහිටුවා ගත් ජන රජයක්, ආර්ථිකයක් හා පාලන ක්‍රමයක් මුල් කර ගෙන වර්ධනය විය. ඇදහිලි විශ්වාස පමණක් නොව, සිරිත් විරිත් ද, භාෂාව ද, සමාජ ධර්ම ද, ජීවන රටාව ද, කලාව ඇතුලු විවිධ ශිල්ප ශාස්ත්‍ර ද ඉහත කී බුදු දහමත්, අශෝක සිරිතත් සම්මිශ්‍රණය වූ සම්ප්‍රදායකින් වර්ධනය විය. ඔපමට්ටම් විය.

විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් වුව ද, අනුරාධපුර, පොලොන්නරු රාජධානි සමයන්හි සෙමෙන් සිදුවන වෙනස්කම් මැද ථෙරවාදී දහමත් ඊට අනුකූලව ගොඩනැගුණු අශෝක සිරිත මුල්කර ගත් සමාජ දහමත් ආරක්ෂා විය. එහෙත් එම රාජධානි කඩා වැටී තෙත් කලාපය ආශ්‍රිතව නව රාජධානි බිහිවීමත්, යුරෝපීයයන්ගේ සංක්‍රමණයෙන් භව භෝග හා ජීවන රටා වෙනස් වීමත් හේතු කොටගෙන වේගවත්

හා විශාල විපර්යාසයන්ට මුහුණදීමට සිදුවිය. අපගේ ථෙරවාද ආගම දහමත්, සමාජ දහමත් එම වෙනස්වීමේ දිය සුළියට හසුවිය.

සියවස් කිහිපයක් තිස්සේ ඊට මුහුණ දී ඇති අප අද 21 වන සියවසේ ආරම්භයේ එහි මුදුන් පෙත්තේ සිටින බවක් හැඟී යයි. ඒ මක්නිසාද යත් අද තරම් ක්‍ෂණ භංගුරතාව හෙවත් සියල්ල මොහොතින් වෙනස් වන, නැසෙන සුළු බව වෙන කවරදාටත් වඩා දැනෙමින් තිබෙන නිසා යැයි මට සිතේ. මේ ලිපිය කියවන ඔබ අත පවතින ජංගම දුරකතනයේ ඇති පහසුකම් ඔබ එය මිලදී ගෙන සාප්පුවෙන් එළියට එන නිමේෂයට වෙනස් වී තිබීම යථාර්ථයයි. එබැවින් එය පරණ වැඩි යයි සිතා යළි සාප්පුවට ගොස් අලුත් කර ගෙන එළියට එන මොහොත වන විට එය තවදුරටත් වෙනස් වී තිබේ. වෙනස් වීම ලොව පිළිගත් ධර්මතාවක් බවට පත්වී තිබේ. කෑම බීම, ඇඳුම් පැළඳුම්, ඉදුම් හිටුම්, සිතුම් පැතුම් සියල්ල ඉක්මනින් වෙනස් වන බව කවුරුත් දනිති. අදහති. ථෙරවාදී බුදු දහමෙහි හරය මෙය නොවේද? අනිත්‍යතාව නොවේද?

එදා වෙනස් වීම අපට දැනුනේ සෙමිනි. එය සමහර විට පියවි ඇසට හඳුනාගැනීමට බැරි තරම් සෙමිනි. පරම්පරා ගණනක් ගිය ද නොවෙනස්ව පවතින ලෙස දැනුණි. එහෙත් අද අදහාගත නොහැකි තරම් වේගයෙන් සියල්ල වෙනස් වේ. වෙනස් නොවීමේ මායාව ඇස් පනාපිට බිඳ වැටෙමින් තිබේ. අපි මේ ගැන විශ්මයට පත්ව ගෝලීයකරණය කියා කම්පාවට පත්ව හිස අත් බදාගෙන කෑ කෝ ගසමින් ඔබ මොබ යමු.

එහෙත් අප ථෙරවාදී බුදු දහමෙහි හරය මත පිහිටා කල්පනා කරන්නේ නම් අද පවතින්නේ වෙන කවරදාටත් වඩා බෞද්ධ සංකල්පවලට එකඟ වූ ලෝකයකි. වෙන කවරදාටත් වඩා අපගේ දහම තේරුම්ගත හැකි, භාවනාවට අරමුණු කර ගත හැකි ලෝකයකි. ගෝලීයකරණය සංකල්පය දාර්ශනිකව වටහා ගත් ප්‍රථම දහම බුදු දහම යැයි සිතමි. එලෙසින් බෞද්ධයින් වශයෙන් නූතන ලෝකය අපට යථා පරිදි ඒත්තුගත හැක්කේ බුදු දහම මත පිහිටා මිස ඉස්ලාම් හෝ කතෝලික හෝ අනෙකුත් ආගම්වල වන දෘෂ්ටීන් හෝ මූලධර්ම මත එල්බ ගෙන නොවේ යැයි සිතමි.

බුදුන් වහන්සේගේ බොහෝ දේශනාවල තමන් දෙස නොව, ධර්මය දෙස සිත් යොමු කළ යුතු බව පෙන්වා දෙයි. අශෝක සෙල්ලිපිවල ද දක්වා ඇත්තේ බුදු දහමේ එන හරයයි. වේගයෙන් වෙනස්වන ලෝකය තුළ බුදු දහම යැයි අප මතුපිටින් කල්පනා කරන වේශය චංචලතාවයට පත් වනු දැකීමෙන් අපි බිය වෙමු. එය වෙනස් වී නැති වී යනු ඇතැයි සිතා කම්පාවට පත්වෙමු. ඊට මුහුණ දීම සඳහා අප තෝරා ගන්නේ අනෙකුත් ආගම්වල එන චර්යා ධර්මය. චේෂ්ටාය. චේතනාය. විලාසිතාය. ඒවා එක්කෝ 17 වන ශත වර්ෂයෙහි දී යුරෝපය පුරා පැතිර ගිය මිථ්‍යාදෘෂ්ටිය මර්ධනය සඳහා වූ කතෝලික මූලධර්මවාදී පූජක මණ්ඩලය සිහිපත් කරවන ව්‍යාපාරයකි. එසේ නැතහොත් 20 වන සියවසේ දී මැද පෙරදිග හා බටහිර ආසියාවේ පැතිර ගිය ඉස්ලාම් මූලධර්මවාදී ක්‍රියාකාරකමක් දෙස බලා ඊට අනුකූලව සකස් කර ගත් විකල්ප විලාසිතාවකි.

බ්‍රිතාන්‍ය වික්ටෝරියානු යුගයේ ආගමික තහංචිවලට අනුකූලව සකස් කරගත් විලාසිතාවක් වශයෙන් කාන්තාවන් කකුල් නොපෙනෙන සේ විලුඹ තෙක් දිගට ගවුම ඇඳීමට නියම වූ අතර කෑම මේසවලට රෙදි එලීමේ දී ද මේස කකුල් වැසෙන පරිදි රෙදි සෑදීම සිරිත විය. කාන්තාවන්ගේ දෙපා නොපෙනෙන සේ ආවරණය කර තිබීමේ චාරිත්‍රය එවකට සාරධර්ම හා සසඳා තේරුම් ගත හැකි නමුත් කෑම මේසවල කකුල් වැසීම ඊට අනුකූලව සකස් කරගත් විලාසිතාවක් මිස හරයාත්මක පිළිවෙතක් ලෙස නොපෙනෙයි.

ප්‍රාණඝාතය පිළිබඳ අශෝක රජුගේ නිගමන හා නියමයන් ඒ පිළිබඳ බුදු දහමේ එන හරය හා තදනුබද්ධය. විවිධ ආගම් පැතිර තිබූ විශාල වශයෙන් සත්ව ඝාතනය සිදුවූ ස්වකීය විශාල අධිරාජ්‍යය තුළ ඔහු සතුන් මැරීම තහනම් නොකළ නමුත් එය සීමා කළේය. ඊට අනුබල නොදුන්නේය. තම මාලිගාවෙහි මස් මාංශ අනුභවය අවම කළේය. මෙම පිළිවෙත් නිසා ඉන්දියාවේ එළවළු පමණක් ආහාරය ගැනීම වර්ධනය වූ බව ඉතිහාසඥයෝ පවසති.

ගෝලීයකරණය හේතු කොට ගෙන ලෝකය සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. මිනිස් ගැටුම්, දේශසීමා අර්බුද, පරිසර විපර්යාස, පරිභෝජන අසමතුලිතතාව කැපී පෙනෙයි. මේ අවුල් ජාලය අප

විපිලිසර කර තිබේ. හන්ග්ටින්ටන් පෙන්වා දෙන්නේ අද පවතින්නේ ශිෂ්ඨාචාර ගැටුමක් බවයි. ලෝක මතවාද කඩා වැටීමෙන් පසු අද එය ශිෂ්ටාචාර ගැටුමක් බවට පරිවර්තනය වී ඇති බව හෙතෙම පෙන්වා දෙයි. බටහිර, ලතින් අමෙරිකානු, අප්‍රිකානු, ඉස්ලාමීය, චීන හා හින්දු ශිෂ්ඨාචාර ඒ අතර වෙයි. මේ ගැටුමේ දී බටහිර ශිෂ්ඨාචාරය ව්‍යාප්ත කළ යුතු බව හන්ග්ටින්ටන් පෙන්වා දෙයි. බහුත්වවාදය, පුද්ගලවාදය, නීතියේ ආධිපත්‍යය, සංස්කෘතික නිදහස, දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය වැනි වටිනාකම් බටහිරින් බිහිවූ ඒවා බව ෆ්‍රැන්සිස් ෆුකයාමා පවසයි. මේ හේතු කොට ගෙන විවාදයක් පැන නැගී තිබේ. මේ කියන වටිනාකම් බටහිරට අයිති ඒවා වන හෙයින් ඒවා ව්‍යාප්ත කළ යුතු බවට තර්ක කරන අතර තවත් පිරිසක් ඒවා බටහිරට අයත් හෙයින් ප්‍රතික්ෂේප කළ යුතුය යන මතයේ සිටිති. එය ශිෂ්ඨාචාර ස ට්ඨනයක් ලෙස එවිට නිරූපණය වෙයි.

එහෙත් මේ කියන වටිනාකම් බටහිරින් මූලාරම්භ වූ ඒවා නොවේ. බටහිර ශිෂ්ඨාචාරයේ ජයග්‍රහණය ද නොවේ. අනිත්‍යතාව, ජීවිතයේ පවිත්‍රතාව, අන් මත ඉවසීම, කරුණාව, අවිහිංසාව, සමානාත්මතාව බොහෝ දෙනාගේ හිතසුව පිණිස කටයුතු කිරීම පළමු වතාවට දේශනා කළෝ බුදුන් වහන්සේය. බුදුන් වහන්සේගේ ධර්මය පදනම් කරගත් ලොව ප්‍රථම ලිබරල්වාදී පාලන තන්ත්‍රය අශෝක රජු යටතේ ක්‍රියාත්මක විය. එම පාලන ආකෘතිය ඉන්දියාවේ හා අග්නිදිග ආසියාවේ සමහර බෞද්ධ, හින්දු, ජෛන පාලකයන් යටතේ ද, මැදපෙරදිග මුස්ලිම් පාලකයන් යටතේ ද රාජ්‍ය පාලනයට යොදා ගන්නා ලදී. ඊට වසර 1800 කට පසුව ද හින්දු, මුස්ලිම්, ක්‍රිස්තියානි හැම සංස්කෘතියකටම, හැම ආගමකටම එකට ජීවත් විය හැකි බව අක්බාර් අධිරාජ්‍යයා තහවුරු කළේය. ඒ අවධියේ දී යුරෝපය දරුණු ආගමික යුද්ධයක පැටලී සිටියේය. යුරෝපයේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය දියුණු වන්නේ 18 වන සියවසේදීය.

බුදුන් වහන්සේ ආණ්ඩු ක්‍රමයක් ගැන දේශනා නොකළ මුත් සප්ත අපරිහානි ධර්මය අනුගමනය කිරීමෙන් රටකට නොපිරිහී සිටිය හැකි බව පෙන්වා දුන්නෝය. අද මහජන ඡන්දයෙන් තෝරා ගන්නා පාලන ක්‍රමයක් තිබුණ ද එය යහපත් රාජ්‍ය පාලනයක් සඳහා ප්‍රමාණවත් නොවන බව මා මෙන්ම මේ ලිපිය කියවන ඔබ ද විශ්වාස කරතැයි

සිතමි. එබැවින් යහපාලනය ගැන අද නිතර කතා කෙරෙයි. මිනිසාගේ හැසිරීමට මනස මුල්වන අතර තැන්පත් මනසක් මගින් තැන්පත් සමාජයක් බිහිවන බව බුද්ධ දේශනාවයි.

අද වෙන කවරදාටත් වඩා මුදල් ඉපයීමේ මාර්ග පැදී තිබේ. වංචාව ද, සූරා කෑම ද වර්ධනය වී තිබේ. සමාජය ණය බරින් යුක්තය. ධනය එකතු කිරීම ගැන, එහි අයිතිය ගැන බටහිර විවිධ අදහස් තිබේ. බුදුන් වහන්සේ පුද්ගලයා තුළ පවතින තණ්හාව ගැන අවධානය යොමු කළ සේක. මූලික වශයෙන් තණ්හාව ගැන ගැටලු විසඳා ගතහොත් අනෙකුත් ගැටලුවලට විසඳුම් ලබාගත හැකි බව දහමෙහි ඉගැන්වෙයි.

තාර්කික චින්තන ක්‍රමය බුදුන් වහන්සේ විසින් හඳුන්වා දෙන ලදී. 21 වන සියවසේ තාක්‍ෂණික දියුණුව පිළිබඳව ඇතැම් ආගම්වලට ප්‍රශ්න තිබේ. මිනිස් මනසට වඩා වේගයෙන් දත්ත විශ්ලේෂණය කිරීමට මිනිසා විසින්ම නිපදවන ලද පරිගණකයට ඇති හැකියාව ගැන බටහිර රටවල් විස්මයට පත්ව සිටිති. බුදු දහමට අනුව මිනිස් මනස දියුණු තියුණු කරන තරමට ඊට වේගයෙන් කරුණු විවරණය කළ හැකිය. ජානකරණය, ක්ලෝනකරණය, පරමාණුව ඇතුලු මෙතෙක් විද්‍යාව මගින් අනාවරණය කොට ඇති කවර සිද්ධාන්තයක් වුව ද බුදුදහමට පටහැනි නොවේ.

විද්‍යා හා තාක්‍ෂණික දියුණුවට පදනම සපයන්නේ නවීකරණයයි. නව යුගයේ ලොව පුරා හමා යන නවීකරණ සංකල්පය බටහිරින් ආගමනය වූවක් වේ. බුදුන් වහන්සේ එහි පුරෝගාමියාය. බුදුන් වහන්සේ ඉදිරිපත් කළේ එකල භාරතයේ මුල් බැස ගෙන තිබූ සාම්ප්‍රදායික අදහස්වලට වඩා වෙනස් වූ නවීන අදහස්ය. ඒ නිසා සාම්ප්‍රදායික සමාජය හා චින්තනය ගුරු කොට සලසන විවිධ බලවේගවලට විරෝධතා හා ඉදිරිවාදිකම්වලට මුහුණදීමට උන්වහන්සේට සිදුවිය.

අවිහිංසාව ගුරු කොට ගත් බුදු දහම මිනිසා මෙන්ම සියලු සත්වයින් ද පරිසරය ද අගය කොට සැලකේ. සතුන්ගේ ජීවිතය දෙවැනි තැන ලා සැලකීම අනුමත නොකරයි. පස, ගහ කොළ, කැලය, සුළඟ මිනිසාට දිවි පැවැත්මට උපකාරී වන නිසා ඒවායේ කළගුණ සැලකීම ඒවා විනාශ කිරීමට අනුබල නොදෙයි. සිටුවන ලද ගසක් ළමයෙකු

PRESIDENTIAL SECRETARIAT
LIBRARY



හදා වඩා ගන්නා සේ රැක බලා ගත යුතු බව ද, ගසක කොළයක් හෝ නොකඩන ලෙස ද දන්වා සිටියි. ජලය අපිරිසිදු නොකරන ලෙස ඉල්ලා සිටියි. හෙළ උරුමය වැනි දේශපාලන පක්ෂ පරිසරය කෙරෙහි පෙර නොවූ විරූ අවධානයක් දැක්විය යුතු බව අවධාරණය කරන්නේ මේ පදනම මත බව මගේ විශ්වාසයයි.

මේ අනුව නව යුගයේ ලක්ෂණ බුදු දහමට පටහැනි නැත. මේ ලක්ෂණ හේතු කොට ගෙන ඇති වන ගැටලුවලට විසඳුම් ද ඒ දේශනාවලියේ හඳුනාගත හැක. වර්තමාන යුගයේ ගති ස්වභාවය හේතු කොට ගෙන පැන නැගී ඇති ගැටලුවලට විසඳුම් සෙවීමට උනන්දුවක් අද බටහිර පවතියි. එබැවින් 21 වන සියවසට ඔබින දහම බුදුදහම බව අපට ලෝකයට පෙන්වා දිය හැකිය. එම මහාර්ඝ දහම අප වෙත සම්ප්‍රාප්ත වූයේ අද වැනි දිනකය. පිරිසිදු ථෙරවාදී දහම අද දක්වා සුරක්ෂිත වූයේ මහින්දාගමනයෙනි. මහින්ද හිමියන්ගේ චින්තනයට පදනම් වූයේ බුදු දහම සහ අශෝක සිරිත ය. එමගින් අපට ආවේණික ශිෂ්ටාචාරයක් හා ජීවන සම්ප්‍රදායක් ස්ථාපිත විණි. පොසොන් පොහොය දින අප සැමරිය යුත්තේ මේ සියලු කරුණු සිත්හි දරාගෙන යැයි මට සිතේ. □

ජනාධිපති ලේකම් කාර්යාලය
24 FEB 2023
පුස්තකාලය

REFERENCE

ගෝලීයකරණය සංකල්පය
දාර්ශනිකව වටහා ගත්
ප්‍රථම දහම බුදු දහම යැයි සිතමි.
එලෙසින් බෞද්ධයින් වශයෙන්
නූතන ලෝකය අපට යථා පරිදි
ඒත්තුගත හැක්කේ
බුදු දහම මත පිහිටා මිස
ඉස්ලාම් හෝ කතෝලික හෝ
අනෙකුත් ආගම්වල
දෘෂ්ටීන් හෝ මූලධර්ම මත
එල්බ ගෙන නොවේ.